# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1828/24 - 2013 සැප්තැම්බර් මස 18 වැනි බදාදා - 2013.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරුමැද පළාතේ පළාත් සභාව

උතුරු මැද පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ රීති හා රෙගුලාසි මාලාවේ (සංශෝධන) හා නීති හා රෙගුලාසි

උතුරු මැද පළාත් සභාවේ 1994 අංක 8 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ පිහිටුවීමේ ප්‍රඥප්තිය යටතේ උතුරු මැද පළාතේ, පළාත් සභාව විසින් 2000 පෙබරවාරි මස 08 වැනි දින සම්මත කරගත් අංක 1121/21-2000 මාර්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික *සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය* පළ කරන ලද නියෝග, උතුරු මැද පළාත් සභාවේ 1994 අංක 08 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තිය IV වැනි කොටසේ පොදු විධිවිධාන, 30.1 යටතේ මා වෙත පැවරී ඇති බලය මත පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව සියලු දෙනාගේ දැන ගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

එච්. බී. සේමසිංහ,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන,
පරිවාස හා ළමාරක්ෂක, කාන්තා කටයුතු,
ප්‍රවාහන සහ නිවාස අමාත්‍ය,
උතුරු මැද පළාත.

#### නියෝග

1. මෙම නියෝග සංශෝධන නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් උතුරු මැද පළාත් ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. — ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

2. ප්‍රධාන නියෝග මාලාවේ අංක 2 යටතේ සඳහන් වන වගන්තියේ (III) උප වගන්තිය යටතේ කාලසටහන් සකස් කිරීම වශයෙන් උප වගන්තියක් එකතු කරනු ලැබේ. — කාල සටහන් සකස් කිරීම

(IIIs) වගන්තිය

(අ) උතුරු මැද පළාත තුළ බස්රථ මගින් මගීන් ප්‍රවාහනය කරන්නේ මගී ඉල්ලුම අවශ්‍යතා හා අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය සකස් කර



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අනුමත කරනු ලබන ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය අනුවය. කිසියම් මාර්ගයක හෝ කොටසක මගී අවශ්‍යතා ඉටුකිරීම සඳහා මුළු දවස පුරා ධාවනය කළ යුතු බස් රථ ගමන්වාර පොදු සැලැස්මකට අනුව සකස් කර ක්‍රියාත්මක කිරීම ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය මගින් ඉටු කරනු ලැබේ. මෙමගින් ඒ ඒ මාර්ගවල මගී අවශ්‍යතා වුවමනාවන් සතුටුදායක ලෙස ඉටු විය යුතු අතර, අනර්තකාරී තරගය වැලැක්වීමටත් කාර්යක්ෂම ධාවනයකට හා පාලනයට ඉඩ සැලසෙන පරිදි ධාවකයන් අතර ඒකාබද්ධ කාලසටහනේ ධාවන ගමන්වාර සාධාරණ ලෙස බෙදාදීමත් අධිකාරිය විසින් ඉටු කළ යුතු ය. ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සමග එකඟත්වයකට පැමිණ සකස් කිරීම අධිකාරිය විසින් ඉටු කළ යුතු ය.

(ආ) ඒකාබද්ධ කාලසටහන මගී ඉල්ලුම වෙනස්වීම, කාලීන සේවා අවශ්‍යතා, පරිපාලන පහසුව, සේවා කාර්යක්ෂම කිරීම, නගරාන්තර සම්බන්ධවන සේවා ඇති කිරීම, මගී ආරක්ෂාව හා පහසුකම් වැඩි කිරීම යනාදී විවිධ හේතූන් මත සංශෝධනය කිරීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය ක්‍රිය කළ යුතු ය.

(ඇ) ඒකාබද්ධ කාලසටහන් ක්‍රමයෙන් බැහැරව මගී ප්‍රවාහනය සඳහා බස්රථ යෙදවීමට ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ගුණාත්මක කාර්යක්ෂම බස් සේවාවක් සඳහා අදාළ ඉල්ලීම් වැදගත් වන අවස්ථාවක උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට ඒ සඳහා විශේෂ අනුමැතියක් ලබාදිය හැකිය. එවැනි අවස්ථාවක මගී ප්‍රවාහන බස් රථ ධාවනය කළ යුතු ධාවන සැලැස්ම ප්‍රවාහන අධිකාරිය විසින් අනුමත කර තිබිය යුතු ය. එවැනි විශේෂ අනුමැතියකින් තොරව ඒකාබද්ධ කාලසටහන් ක්‍රමයෙන් බැහැරව කිසිම පුද්ගලයකුට/සමාගමකට/ආයතනයකට/මණ්ඩලයකට මගී ප්‍රවාහනය සඳහා බස් රථයක් යෙදවීම නොකළ යුතු ය.

(ඈ) පාසැල් ළමුන් පමණක් ප්‍රවාහනය කරන පාසැල් ගමන් වාර, කාර්යාල සේවා, රාත්‍රී හා අළුයම් ධාවනය කිරීමට විශේෂිත සේවා, තැපැල් හා වෙනත් විශේෂිත සේවා අවශ්‍යතාවය පරිදි ඒකාබද්ධ කාලසටහන්වලින් ඉවත් කර ධානය කරවීමටද අධිකාරියට හැකිය.

(ඉ) ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීමේදී මාර්ගය තෝරාගැනීම, ගමනාන්ත තීරණය කිරීම, මාර්ග අංක නම් කිරීම, මගීන්ගෙන් අය කළ යුතු ගාස්තු සකස් කිරීම ධාවන කාල පරීක්ෂණ හා ධාවන කාල තීරණය කිරීම, මගී සමීක්ෂණ පැවැත්වීම, මගී ඉල්ලුම තක්සේරු කිරීම, සේවා නැවත සැලසුම් කිරීම හා සංශෝධනය කිරීම මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් අවශ්‍ය අවස්ථාවලදී සිදු කළ යුතු ය. අදාළ කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු නිර්නායකයන් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය මගින් රෙගුලාසි වශයෙන් පනවනු ලැබේ.

(ඊ) නව සේවාවන් ආරම්භ කිරීමේදී ඒ සඳහා රාජ්‍ය බස් සේවයක් ලබාදිය යුතු ද නැතහොත් පෞද්ගලික බස් සේවයක් ලබාදිය යුතු ද යන්න ඉදිරිපත් වන ඉල්ලීමේ ස්වභාවය හා ධාවක හැකියාවන් අනුව අධිකාරිය විසින් තීරණය කළ යුතු ය. නව මාර්ගය පිළිබඳව සමීක්ෂණ හා තොරතුරු අනුව ගමනා ගමන යෝජනාවක් ඉදිරිපත් කළ යුතු අතර, එම යෝජනා සැලකිල්ලට ගෙන සේවා ආරම්භ කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්විය යුතු ය.

(උ) වෙනත් පළාත් සභාවක ප්‍රවාහන අධිකාරියක් හෝ බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරියක් හෝ ජාතික ගමනා ගමන කොමිෂන් සභාව හෝ මෙම පළාත් සභා බල ප්‍රදේශය තුළට බස්රථයක් ධාවන කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ එකඟතාවය ලිඛිතව ලබාගත යුතු වේ. එවැනි සේවා ඒකාබද්ධ කාලසටහන් ක්‍රමයට එකඟ නොවිය යුතු අතර, අනවශ්‍ය තරඟකාරිත්වයක් නොවන පරිදි පැවැත්වීමට කටයුතු කිරීම බලපත්‍ර අධිකාරිය හා ධාවකයාගේ වගකීම වේ.

(ඌ) පවතින ඒකාබද්ධ කාලසටහන්වල සේවා සමග අනර්ථකාරී තරඟයක් ඇතිවීම හෝ ඇතිවිය හැකිවීම වෙනත් සේවා සමග ගැටුම්කාරිතත්වයක් පැන නැගීම හෝ පැන නැගීමට ඉඩ

තිබීම, අනෙකුත් ධාවන කාලසටහන්වල ආදායම්වලට ප්‍රභල ලෙස හානි සිදුවන අන්තර් පළාත් සේවාවන් තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ ගමන්වාර අත්හිටුවීමට ක්‍රියා කරනු ලැබිය හැකිය.

(එ) වෙනත් ප්‍රවාහන අධිකාරියකින් හෝ ජාතික ගමනා ගමන කොමිෂන් සභාව මගින් හෝ ලබාගෙන ඇති මගී ප්‍රවාහන ධාවන බලපත්‍ර පරීක්ෂා කිරීමට සහ ප්‍රධාන ප්‍රඥප්තියේ බලතල අනුව කටයුතු කිරීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියට බලය ඇත.

(ඒ) කාලසටහන් ක්‍රියාත්මක කිරීමේදී මගී අවශ්‍යතාවය පිළිබඳ වැඩි අවධානයකින් යුක්තව අවශ්‍ය අවස්ථාවලදී ධාවන පාර්ශවයන් සමග සාකච්ඡා කර කාලසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. කාල සටහනේ ගැටළු පවතින්නේ නම් ඒ පිළිබඳ ධාවකයින් අධිකාරිය වෙත දැන්වීමට කටයුතු කළ යුතු අතර සති දෙකක ධාවනයකින් පසු ඒ පිළිබඳ නැවත සමාලෝචනය කර සුදුසු සංශෝධන සහිතව ක්‍රියාත්මක කිරීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය කටයුතු කළ යුතු ය.

(ඔ) ඒ ඒ මාර්ගවල ඒකාබද්ධ කාලසටහන් මගින් දිනයක් සඳහා සැලසුම් කර ඇති සියලුම ගමන්වාර නියමිත කාලසටහනට අනුව ධාවනය කරවීම මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ස්ථාවර පාලකවරුන්ගේ ප්‍රධාන කාර්යයක් වන අතර, යම් යම් හේතු මත නියමිත බස්රථය ධාවනයට නොපැමිණීම නිසා ධාවනයෙන් අඩුවන ගමන්වාර පොරොත්තු බස්රථ හෝ බලපත්‍ර සහිත වෙනත් බස්රථ උපයෝගී කරගෙන ධාවනය කරවීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් ක්‍රියා කළ යුතු ය.

(ඕ) ඒකාබද්ධ කාලසටහනේ අනුමත සියලුම ගමන්වාර ධාවනය කරවීමට අදාළව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග වරින් වර මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් රෙගුලාසි වශයෙන් පැණවීමට කටයුතු කරනු ලැබේ. අඩුවන ගමන්වාර ධාවනයට ඉඩ සැලසීමේදී අදාළ මාර්ගයේ සියලුම ධාවකයින්ට බෙදී යන පරිදි හෝ අඛණ්ඩ ධාවනය සඳහා ස්ථිර ධාවකයකු පත් කිරීම හෝ කළ යුතු ය.

(ක) පාසල් සිසුන් ප්‍රවාහනය කිරීම, විශේෂ උත්සව, රැස්වීම් හෝ මහජනතාව එක්රැස් වන අවස්ථාවල ඒකාබද්ධ කාලසටහන් ක්‍රමයකට අතිරේක ගමන්වාර අවස්ථානුකූලව යෙදවීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියට හැකිය.

3. ප්‍රධාන නියෝග මාලාවේ අංක 2 යටතේ සඳහන් වන වගන්තියේ (iv) උප වගන්තිය යටතේ බස්නැවතුම්පල සංවිධානය හා කළමණාකරනය වශයෙන් උප වගන්තියක් එකතු කරනු ලැබේ. බස්නැතුම්පල සංවිධානය හා කළමණාකරනය

IV වගන්තිය

(අ) උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය තුළ ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය අනුව ධාවනය වන සියලුම බස්රථ කාර්යක්ෂමව හා සාධාරණ ලෙස පරිපාලනය කර විධිමත් මගී ප්‍රවාහන සේවාවක් මගී ජනතාවට ලබාදීම සඳහා සියලුම බස්නැවතුම්පල වල බස්රථ සේවා කළමණාකරනය මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් ක්‍රියාත්මක කළ යුතු ය.

(ආ) මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අනුමැතියකින් තොරව වෙනත් කිසිදු පුද්ගලයකුට හෝ ආයතනයකට හෝ බස්නැවතුම්පලකට බස්රථ ඇතුළ් කිරීම, පිට කිරීම, ලේඛන සටහන් කිරීම හෝ මගීන් නැංවීමට කටයුතු කිරීම, කැගසා මගීන් එක්රැස් කිරීම, ආසන වෙන් කිරීම හා බස් සේවා කළමණාකරනයට අදාළ කිසිවක් නොකළ යුතු ය.

(ඇ) මගී ජනතාවට ප්‍රමාණාත්මක හා ගුණාත්මක බස් සේවාවක් ලබාදීමට හැකිවන පරිදි හා සියලු ධාවකයින්ට ඒ සඳහා ස්ථාන පහසුකම් සලසා දීමට හැකි වන අයුරින් විධිමත් සේවා පරිපාලනය පහසු කිරීමට උතුරු මැද පළාත් සභාව විසින් සියලුම බස් නැවතුම්පලවල් නිදහසේ පරිහරනය සඳහා උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ස්ථිර වශයෙන් හෝ තාවකාලික පැවරීම හෝ මුදා හැරීම කළ යුතු ය.

(ඇ) උතුරු මැද පළාත තුළ ස්ථාපිත සියළුම බස් නැවතුම්පලවල් නිසි පරිදි නඩත්තු කිරීම ප්‍රවාහන අධිකාරියේ වගකීම වේ.

(ඉ) මගී ප්‍රවාහන බස් සේවා කළමණාකරනය හා බස්ගාල් පහසුකම් ලබාදීම වෙනුවෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියට ගෙවිය යුතු නීත්‍යානුකූල මුදල් හැර මගී ප්‍රවාහන බලපත්‍ර හිමි ධාවකයෙකු හෝ සේවකයෙකු වෙනත් පුද්ගලයකුට හෝ ආයතනයකට කිසිම මුදලක් නොගෙවිය යුතු ය.

(ඊ) බස්නැවතුම්පලට බස්රථය හැසිරවීමට කළමණාකරනයට උපදෙස්දීම හා විස්තර ලබාගැනීමට, මගීන්ගේ හා ධාවකයන්ගේ ගැටළුවලට සුදුසු විසඳුම් ලබාදීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් පත්කර ඇති ස්ථාන පාලකවරුන්, ජංගම නිලධාරීන් හා සෙසු බලය පැවරූ නිලධාරීන් විසින් ක්‍රියා කළ යුතු ය.

(උ) මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ බස්නැවතුම්පලවල සියළුම නිලධාරීන් නිල ඇඳුමකින් හෝ ලාංඡනයක් හා අධිකාරිය විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පතක් සහිතව සේවයේ යෙදිය යුතු ය. එසේ නොමැති කිසියම් පුද්ගලයකු හෝ සංවිධානයක් හෝ බස් සේවා කළමණාකරනයට සම්බන්ධවීම වැලැක්වීමට හා නීති මගින් ක්‍රියා කිරීමට පොලිස් නිලධාරීන්ට හා අධිකාරියේ නිලධාරීන්ට බලය ලැබේ.

(ඌ) බස්නැවතුම්පලකදී මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් පත්කරන ලද නිලධාරියෙකු විසින් බස් සේවා කළමණාකරනයට අදාලව දෙනු ලබන සියළුම නීත්‍යානුකූල නියෝග හා උපදෙස් බස්නැවතුම්පලේ අනෙකුත් සියළුම පාර්ශවයන් පිළිගත යුතු ය. ඒ අනුව කටයුතු කළ යුතු ය.

(එ) බස්නැවතුම්පලක් තුළ මගීන්ගේ, ධාවකයින්ගේ, සේවකයින්ගේ දැනගැනීම සඳහා අවශ්‍යයැයි අධිකාරිය අදහස් කරන ප්‍රචාරණ කටයුතු, තොරතුරු සැපයීම, කාලසටහන් ප්‍රදර්ශනය හා වෙනත් කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන විස්තර ඉදිරිපත් කිරීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය කටයුතු කළ යුතු ය.

(ඒ) මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අනුමැතියකින් හෝ එකඟතාවයකින් තොරව බස්නැවතුම්පලක හෝ බස්රථයක් තුළ වෙළඳාම් කිරීම, ප්‍රචාරක කටයුතු කිරීම, ප්‍රචාරක දැන්වීම් බෙදා හැරීම, ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම, ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම නොකළ යුතු ය.

(ඔ) බස්නැවතුම්පලෙහි මගීන්ට අවහිර වන ලෙස රැඳී සිටීම, නිකරුනේ රැඳී සිටීම, දුම්පානය කිරීම, බීමත්ව හැසිරීම, කලහකාරී ලෙස හැසිරීම, පරිපාලන කටයුතුවලට බාධා කිරීම, මුදල් ඉල්ලීම හෝ අයැදීම නොකළ යුතු ය.

(ඕ) නව බස්නැවතුම් ස්ථාන ඉදිකිරීමේදී මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අනුමැතිය ලබාගත යුතු අතර, නියමිත ප්‍රමිතීන්ට අනුව ඉදිකිරීම් කළ යුතු ය. බස්නැවතුම්පලක් බස් සේවා ආරම්භවන හා අවසන්වන ස්ථානයක් වන අතර, මගීන් නගින බසින හා මාරුවන ස්ථානයක් වශයෙන් සැළකිය යුතු ය. එය සංකීර්ණ බස් සේවා කළමණාකරන මධ්‍යස්ථානයක් වන්නේය. ඒ අනුව බස් සේවා පරිපාලනයට පහසුකම් සැපයීම, මගීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම, බස්රථ ගාල් කිරීමට පහසුකම් හා සේවක පහසුකම් පිළිබඳ මූලික අවධානය ඇතිව ඉදිකිරීම් කළ යුතු ය. බස්නැවතුම්පලක අත්‍යවශ්‍ය මූලික කරුණු වලට බාධා වන හෝ පරිපාලනයට ගැටළු පැනනගින බාහිර ඉදිකිරීම් හෝ ක්‍රියාකාරකම් පැවැත්වීම නොකළ යුතු ය.

(ක) ඉහත නියෝග ක්‍රියාත්මක කිරීම වැලැක්වීම හෝ කඩ කිරීම වරදක් වන අතර, ප්‍රඥප්තිය ප්‍රකාර ඒ සඳහා නීත්‍යානුකූල කටයුතු කරනු ලැබේ.

(ග) ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය යටතේ උතුරු මැද පළාත් බලප්‍රදේශය තුළ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය මගින් බස් සේවා කළමණාකරනය කරනු ලබන බස්නැවතුම් ස්ථාන උප ලේඛන 06හි ඇතුළත් වේ.

4. ප්‍රධාන නියෝග මාලාවේ පස්වන උපලේඛනයට අනතුරුව හයවන උපලේඛනය නමින් පළාත තුළ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය මගින් බස් සේවා කළමණාකරනය කරනු ලබන බස්නැවතුම්පල ස්ථාන පහතින් සඳහන් කරනු ලැබේ. බස්නැවතුම්පල ස්ථාන

**හයවන උපලේඛනය**

*බස්නැවතුම්පල ස්ථාන*

1. අනුරාධපුර දිස්ත්‍රික්කය

1.1 පැරණි බස්නැවතුම්පල
1.2 දුර සේවා බස්නැවතුම්පල
1.3 නව බස්නැවතුම්පල
1.4 කැකිරාව බස්නැවතුම්පල
1.5 තඹුත්තේගම බස්නැවතුම්පල
1.6 ගල්නෑව බස්නැවතුම්පල
1.7 තලාව බස්නැවතුම්පල
1.8 ගල්කිරියාගම බස්නැවතුම්පල
1.9 හොරොව්පොතාන බස්නැවතුම්පල
1.10 කහටගස්දිගිලිය බස්නැවතුම්පල
1.11 මිහින්තලය බස්නැවතුම්පල
1.12 මැදවච්චිය බස්නැවතුම්පල
1.13 කැබිතිගොල්ලෑව බස්නැවතුම්පල
1.14 නොච්චියාගම බස්නැවතුම්පල

2. පොලොන්නරුව දිස්ත්‍රික්කය

2.1 හිගුරක්ගොඩ බස්නැවතුම්පල
2.2 කදුරුවෙල බස්නැවතුම්පල
2.3 බකමූණ බස්නැවතුම්පල
2.4 වැලිකන්ද බස්නැවතුම්පල
2.5 සිරිපුර බස්නැවතුම්පල
2.6 මින්නේරිය බස්නැවතුම්පල

**උප බස්නැවතුම්පල ස්ථාන**

1. අනුරාධපුර දිස්ත්‍රික්කය

1.1 පුබුදුපුර බස්නැවතුම්පල
1.2 පණ්ඩුලගම බස්නැවතුම්පල
1.3 කවරක්කුලම බස්නැවතුම්පල
1.4 නාච්චාදූව බස්නැවතුම්පල
1.5 පරාක්‍රමපුර බස්නැවතුම්පල
1.6 තන්තිරිමලය බස්නැවතුම්පල
1.7 පේමඩුව බස්නැවතුම්පල
1.8 කලාඔය බස්නැවතුම්පල
1.9 ගලෙන්බිඳුනුවැව බස්නැවතුම්පල
1.10 හබරණ බස්නැවතුම්පල
1.11 රඹෑව බස්නැවතුම්පල
1.12 එප්පාවල බස්නැවතුම්පල
1.13 ඇලයාපත්තු හන්දිය බස්නැවතුම්පල

2. පොලොන්නරුව දිස්ත්‍රික්කය

2.1 මැදිරිගිරිය බස්නැවතුම්පල
2.2 අරලගංවිල බස්නැවතුම්පල
2.3 සුංගාවිල බස්නැවතුම්පල
2.4 ඕනෑගම බස්නැවතුම්පල
2.5 කටුවන්විල බස්නැවතුම්පල
2.6 දිඹුලාගල බස්නැවතුම්පල
2.7 ගිරිතලේ බස්නැවතුම්පල
2.8 සෙවණපිටිය බස්නැවතුම්පල
2.9 වෙහෙරගල හන්දිය බස්නැවතුම්පල

10-103

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 - PG 1756